## විකල්ප හොරු
**ආනන්දගුණතිලක - හොපර්ස් ක්‍රොසිං**

“දෙසිය විසි පහම කුණු උන ජරාවක්
අධිකරණයත් ඒ වාගෙම මුලාවක්”
කිය කිය අළුත් ව්‍යවස්ථා කතාවක්
නාගා නන්ද ආවා එක වතාවක්

මවු බිම තුලට නොගියත් අදහස වපුරා
පිටරට වෙසෙන සිහළුන් හට එය මතුරා
පුරසාරම් දෙඩා - වනසන්නට හතුරා
බැංකුවෙ ගිණුම පුරවා ගත්තලු උතුරා

ඇත්තද බොරුවක්ද කියලා නැහැ දන්නේ
අමුතුම කතාවකි අද ඔහු පව සන්නේ
මිලියන් ගණනකට පිටරට වැසි යන්නේ
හෙන ගැහුවද කියා - දුන් අය විම සන්නේ

මුදලට නටන - රූකඩ බටහිර ගැත්තෝ
තම අරමුණු වලට තෝරා ගත ‘ඉත්තෝ’
මේ ඔසි රටෙත් - දුර දිග නොබලප ඇත්තෝ
තමනගෙ පස්ස - ‘ඉල්ලා බිම ඇන ගත්තෝ’

වියපත් වෙලා - නීතිය අකුරට දන්නා
තම අත් දැකීමෙන් පිරිපුන් බව පෙන්නා
අරගෙන සිංහ වෙස් රඟ පාමින් ඉන්නා
පණ්ඩිතයට උනත් ඉඳ හිට වර දින්නා

‘තවෙකෙක්’ එදා ෆොන්සේකට වැඩ කරලා
නීතිය කැඩු බයට මැද පෙරදිග පැනලා
ඇමරිකානු හමුදා සේවෙට බැඳිලා
දෙදහස් පහලොවෙයි යලි ආවේ දුවලා

හිඟ පඩි සමග තනතුර නැවතත් ගන්නේ
ඇමරිකාව මිනිහගෙ පසු පස ඉන්නේ
හමුදාපති කමත් රහසෙම ලැබ ගන්නේ
අමුතුම චරිතයකි ඔහු දැන් රඟ දෙන්නේ

දෙදහස් දහයෙ ජනපති තෝරන අස්සේ
නිල ඇඳුමෙන් තමයි ඔහු සටනට බැස්සේ
බටහිර එවුන් හිටි හින්දා අපි පස්සේ
පැන්නේ රටින් ඔවුනගෙ උපදෙස ඔස්සේ

තුන් සියයක් පමණ පිරිසක් මරා ගෙන
සිය ගණනකගෙ ඇස් අත පය සොරා ගෙන
මිණී මරපු උන් - ‘බලයෙන්’ වසා ගෙන
කොහොමද නඩය - කොළ පාටට හිනා වෙන

පුංචි කාර් - ෆ්‍රී වයි අර ගන්න
රැවටුනු අයට - යලි ‘මිරිඟුව’ පෙන නන්න
එන හොරු රැලගෙ - මැර කම් යලි නර ඔන්න
රැවටෙන අමනයින් නැති බව දැන ගන්න

## නෑන මස්සිනා
**බණ්ඩාර කුමාර්ස්නායක**

නෑන මස්සිනා උනාට නෑකම හින්දා
සීන මලක් පිපුන නේද තරු මල් පරදා
දාන මුදුවෙ රනින් කරල ආලය අන්දා
හිනා මලක හැඩ බැලුවා ගෙදරට කැන්දා

පුංචි කාලෙ එකට හැදුන හැටි සිහි උනිදෝ
පැංචි කාලෙ නැන්දම්මගෙ හිත රැවටුවදෝ
රංචු රංචු සමනලයින් කොහේ ගිහින්දෝ
හැංගු කතා සමන් දෙවිදු හට කියන්නදෝ

කීර හිඹුටු කජු නාරං වෙල් ඉස්මත්තේ
සාර කුඹුරු වෙල් ඉපනැලි සිත අර ගත්තේ
සූර කමට නෙලා ගත්තෙ මල මල් වත්තේ
නෑර මලක් සිබින්න නොගියට ජය ගත්තේ

රංඩු වෙච්ි යාලු වෙච්ි මුනි වත රැකලා
තෝඩු වලට රං ආකර ගෙනාව බිඳලා
කෝඩු කමට දිනන්න දෛවය පරදාලා
ජෝඩු දාල යමු නෑනෙ හිනැහෙන හඬලා

## සසර ගමන
**ජයසේන කොඩිතුවක්කු**

මොන අමාරුවකින් ද
පිං කන්දක් වැය කරල
මේ පංචස්කන්දය
ලබා ගත්තේ

දස වද විඳලයි
සිජ් සතර ජය ගත්තෙ
බඩ වියත රැක ගන්න
නොවී කාටත් බරක්

සෙයිලමට වහ වැටිල
කොටු වුනා ගාලක
ගැළවිලා පිහාටු
සිර විය එක්ටැමක

පීදුනා මල් දෙකක්
සුවඳින් අනූනයි
එත් ළඟ නෑ
දුරු රටක බැබලේ

පිළිගනිම් එක හිතින්
අවනතයි සොබා දහමට
තනිව ආ ගමනක්
තනිව යා යුතු නේද

සසර කෙළවර තෙක්
ගමනට අවැසි දේ
සිත් පුරා හරි කරන්
යන්න ඉඩ දෙන්න මට

දුකයි නුඹ ගැන මට
මුදා ගන්නට කුරුසෙන්
දැරූ වෙර අපතේද
නුඹට පිං මදිවද ?

## ශ්‍රී සම් බෝධි විහාරය ඉදිරිපිට ඇත් රුව
**ජයසේන කොඩිතුවක්කු**

දුටුවම ගාම්භීරයි පෙනුමෙන ඉහලයි
කැලයක නොවෙයි ඉන්නේ මේ කොළඹ හතෙයි
ගැස්සුනි මගෙ හිතත් එකවර හරි පුදුමයි
මිනිහෙක් හදපු අලියෙක් අඩු පණ විතරයි

සද්දන්තයෝ කැලයේ රජ කරන හැටී
හෙන්ඩුව නිසා මිනිසුන් ළඟ දණින් වැටී
උගේ තරම දැක ගත්තොත් ඌට වටී
සිතේ සතුට කැලයේ සිට විඳිත හැකී

වීරියවන්ත එක හිත ඇති සතෙක ඇතා
නොමරා මරයි මිනිසා වැඩ ගද්දි සතා
උගෙ රුව ඉදිරියේ කතිරයෙ ලකුණ ගසා
අවමන් කරති මිනිසුන් උගෙ ගුණ නොතකා

උගේ කැලය අපි වනසා දැමුවාම
කුසට අහර සොයනව පීරමින් ගම
වරද පිළිගන්න අකෙමැති මිනිස් තෙම
දිවි උගෙ තොර කරයි අමතක කර දහම

## අම්මා
**බණ්ඩාර කුමාර්ස්නායක**

කුල්ලට සැලෙන වී ඇට තෝරා සොඳින
නෑබිලියත් කොරහ සෙල්ලම් බඩු ගාන
හිරමනයට බරව පොල් කටු මද අරින
වංගෙඩි මෝල් ගහ දුනු ඊතල ගාන

ලුනු මිරිසකට අහුවෙන ගල් වංගෙඩිය
අල රතු බතල කොස් දෙල් බත් හරි රසය
ගොවි තැන් උපාධිය ලද ඇය පල බරය
පාසැල් නොගිය ඇය ගනිතයෙ ගුරුවරිය

අම්මා වරුන් කොහොමත් හරි ලස්සනය
ගම් බද ගැමි මවුන් හැමවිට සමබරය
දැනෙනා පිපාසෙට වී උල්පත ජලය
බෙදනා සෙනෙහසද දරුවන් වෙත සමය

උපදේශිකා ඇය පිටිසර ගම සරුය
දරුවන් ඇගේ පාසැලෙ දැන ගුරුවරුය
දැක්කම සිරියාව තුරුලට යා යුතුය
අම්මා ඇය තමයි අත්ත මිමත් ඇයය

